# අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳවැටීම

ඊ. ජී. එම්. කුලරත්න
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
arundathi19910720 @ gmail .com

**සංක්ෂේපය**

ලාංකීය රාජධානි නාමාවලිය තුළ පළමු රාජධානිය අනුරාධපුර රාජධානියයි. අනුරාධපුර රාජධානි සමය ස්වර්ණතම ශිෂ්ටාචාරයක් පැවති අවධියකි. ශතවර්ෂ 15 ක් පමණ ක්‍රියාත්මක වූ රජරට ශිෂ්ටාචාරයෙහි දීර්ඝතම කාලයක් ක්‍රියාත්මක වූ රාජධානිය වන්නේද අනුරාධපුරයයි. මෙම රාජධානි සමය තුළ පාලකයන් ගණනාවක්ම රාජ්‍ය පාලනය කර ඇත. දුටුගැමුණු රජු යටතේ ලංකාව එක්සේසත් වීමද සිදුවිය. නමුදු හේතු සාධක ගණනාවක් මත අනුරාධපුර රාජධානිය පරිහානියට පත්ව බිඳවැටීම සිදුවිය.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ අනුරාධපුර රාජධානියෙහි පරිහානිය හා බිඳවැටීමට හේතු වූ කරුණු පිළිබඳව විමර්ශනය කිරීමයි. මේ අනුව දුර්වල පාලකයන් බලයට පත්වීම, චෝළ ආක්‍රමණ, ආර්ථික පරිහානිය ආදී කරුණු රැසක් අනුරාධපුර රාජධානියේ පරිහානියට හා බිඳවැටීමට බලපෑ බව පැහැදිලි වේ. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය මෙන්ම ඒ ඇසුරින් ලියූ ද්විතීය මූලාශ්‍රය ද භාවිතා කෙරිණි.

ඒ අනුව ලංකාවේ දීර්ඝතම කාලයක් ක්‍රියාත්මක වූ අනුරාධපුර රාජධානිය දුර්වල පාලකයන් බලයට පත්වීම ආදී හේතු ගණනාවක් මත පරිහානියට පත් වූ බව ද චෝළ ආක්‍රමණ හමුවේ බිඳ වැටීමට ලක් වූ බව ත් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :- අනුරාධපුරය, චෝළ ආක්‍රමණ, පරිහානිය.**